# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකළපුව

# ලංසු සඳහා ආරාධනයයි

01. මඩකලපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපතිවරයා විසින් පහත වගුවේ දක්වා ඇති ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍ර තැබූ ලංසු මෙයින් කැඳවනු ලැබේ.

02. මෙම ලංසුකරණය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය(NCB) මගින් මෙහෙයවනු ලබන අතර, ප්‍රතිපාදන ශ්‍රී ලංකා රජය විසින් වෙන් කරන ලද අරමුදල් මගින් සපයනු ලැබේ..

03. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට නම්, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනයට ඇතුලත් නොවූවකු විය යුතු අතර, පහත වගුවේ දක්වා ඇති CIDA ලියාපදිංචි සහ සුදුසුකම් සපුරාලිය යුතුය. තවද, රුපියල් මිලියන 5.0 ඉක්මවන කොන්ත්‍රාත්තු වටිනාකම සඳහා 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුව ලංසුකරුවන් ශ්‍රී ලංකා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය. PCA-03 සහතිකය හෝ අදාළ සාක්ෂි ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

04. සුදුසුකම් ලැබීමේ අවශ්‍යතා ප්‍රසම්පාදන ලේඛනවල 4 වන කොටසේ දක්වා ඇත. අතිරේක තොරතුරු ප්‍රසම්පාදන ලේඛනවල 5 වන කොටසේ දක්වා ඇත.

05. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු **දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, තිරායිමඩු, මඩකළපුව** (දුරකථන අංකය :0652222233, ෆැක්ස් : 0652224466) වෙතින් ලබාගත හැකි අතර, ඕනෑම වැඩ කරන දිනයක 09.00 පැය සිට 15.00 පැය දක්වා පහත සඳහන් ලිපිනයෙන් ප්‍රසම්පාදන ලේඛන පරීක්ෂා කළ හැකිය.

`6. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක්, උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් පහත ලිපිනයට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසුව 2026.07.28 සිට 2026.08.17 දක්වා ඕනෑම වැඩ කරන දිනයක 09.00 පැය සිට 15.00 පැය දක්වා, වගුවේ දක්වා ඇති එක් කට්ටලයක් සඳහා වන ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා ලබාගත හැකිය. ගෙවීම් මුදලින් සිදුකළ යුතුය.

07. ලංසු ලියාපදිංචි තැපෑලෙන් 2026.08.18 දින 15.00 පැයට හෝ ඊට පෙර **සභාපති, දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, තිරායිමඩු, මඩකළපුව** මෙත එවිය යුතුය. නැතහොත් මඩකළපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ පහත ලිපිනයේදී සිදු කෙරේ.

08. සියලුම ලංසු සමග පහත වගුවේ දක්වා ඇති තොරතුරු අනුව බැංකු ඇපකරයක් / ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල ඇපකරයක් හෝ ආපසු ගෙවන මුදල් තැන්පතුවක් ලෙස සුදුසු ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. මුදල් තැන්පතුවක් කරන්නේ නම්, ලංසුකරු විසින් මඩකළපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුදල් තැන්පත් කළ යුතු අතර, මුල් මුදල් ලදුපත ලංසුව සමග අමුණා ඉදිරිපත් කළ යුතුය.

09. ලංසු **"මුල් පිටපත"** සහ **"අනු පිටපත"** ලෙස ඉදිරිපත් කල යුතුය. මුල් අනුපිටපත සහ අනු පිටපත වෙන වෙනම මුද්‍ර තැබූ කවරවල බහා පිළිවෙළින් **"මුල් පිටපත"** සහ **"අනුපිටපත"** ලෙස සලකුණු කළ යුතුය. කවර දෙකම තනි මුද්‍ර තැබූ කවරයක බහා, එහි ඉහළ වම් කෙළවරේ කාර්යයේ විස්තරය සහ ලංසු අංකය සඳහන් කළ යුතුය.

10. පූර්ව ලංසු රැස්වීම 2026.08.11 දින 14.30 පැයට මඩකළපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වේ.

11. කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර ඕනෑම අවස්ථාවක මෙම ප්‍රසම්පාදනය අවලංගු කිරීමට හෝ ඉල්ලා අස්කර ගැනීමට අයිතිය සේවායෝජකයා සතු වේ.

| කාර්යයේ විස්තරය සහ ලංසු අංකය | සෘජු ඉදිකිරීම් පිරිවැය (රු. මිලියන) (බදු රහිත) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ අවශ්‍යතාවය | කොන්ත්‍රාත් කාල සීමාව | CIDA ලියාපදිංචිය සහ විශේෂඥතාව | ලංසු වලංගු කාලය තෙක් දිනය | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.) සහ වලංගු තෙක් දිනය | නැවත නොගෙවන ගාස්තුව (රු.) | කාර්යයේ විෂය පථය |
|---|---|---|---|---|---|---|---|---|
| මඩකළපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරය (දෙවන මහලේ පිටුපස අංශය), සම්පූර්ණ කිරීම. ලංසු අංකය : ADM/KNBuilding/ D02/2026) | 151.0 | අවශ්‍ය වේ. | ලිත් දින 182 | C4 හෝ ඉහළ | 2026-11-17 | 2,260,000.00 2026-12-15 දක්වා | 27,000.00 | කොන්ක්‍රීට් වැඩ, පෙදරේරු වැඩ, ජල රෝධක වැඩ, ලෝහ වැඩ, ජලනල වැඩ, බිත්ති, සිවිලිම සහ බිම නිමා කිරීම, විදුලි ස්ථාපනය කිරීම, පින්තාරු වැඩ, ශ්‍රවණාගාර වේදිකා වැඩ, ශ්‍රවනාගාර ධ්වනි විද්‍යාත්මක සැකසුම් සහ ශබ්ද පද්ධති වැඩ. |

**ජේ. එස්. අරුල්රාජ්**
**සභාපති,**
**දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම්,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, තිරායිමඩු, මඩකළපුව.**

ම... අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.